# කැසුබු පරපුර

**සාගරයේ ජීවත්වන විවිධ ජීවීන් වර්ග අතරින් සමාජයේ දැඩි අවධානය දිනාගත් සත්තව විශේෂයක් ලෙස කැසුබු පරපුර හඳුන්වාදිය හැකිය. උරග පවුලට අයත් කැසුබුවන් සත්ත්ව විද්‍යාවේදී 'රෙප්ටිලියා' යන නමින් හඳුන්වන බඩගා යන සත්ත්ව පරපුරට අයත් ලෙස සැලකේ.**

කැස්බෑවන් පිළිබඳ ඉතිහාසය ඉතා දීර්ඝ එකකි. ඔවුන් මීට අවුරුදු දස ලක්ෂ ගණනකට පෙර මෙසසොයික යුගයේදී බිහිවූ බව විශ්වාස කෙරේ. අද ජීවත්වන කැසුබුවන්ගේ ආදිතම ඥතියා වත්තේ 'ආර්වෙලෝන්' බව හඳුනාගෙන තිබේ. මොහු මීටර් 35 ක් පමණ දිගින් යුතු බර ටොන් 2 ක් පමණ වන සතකු බව පොසිල මඟින් සනාථ වී තිබේ.

සාගරයේ ජීවත්වන කැසුබුවන් තම සාමාන්‍ය දිවිපෙවත ගත කිරීමේදී උදකාලයේ හිරුඑළියෙන් දේහ උෂ්ණත්වය වැඩිකර ගනී. ඔවුන් සාමාන්‍යයෙන් විනාඩි 20–30 අතර කාලයක් දියමතුපිටට පැමිණ පෙනහළු මඟින් ආශ්වාස කරයි. බොහෝවිට රාත්‍රී කාලයේ අක්‍රියව සිටින ඔවුන් රාත්‍රිය පුරාම ආශ්වාස ප්‍රාස්වාසයෙන් තොරව සාගර පත්ලේ ඇති අඳුරු ස්ථානවල ගතකරයි.

සාගරයේ ජීවත්වන කැසුබුවන් ගොඩබිම වෙත පැමිණෙනුයේ බිත්තර දැමීම සඳහා පමණකි. රංචු වශයෙන් පැමිණ බිත්තර දමායාම මේ සත්වයාගේ චර්යාවයි. තෝරාගත් යම් ස්ථානයකට සැතපුම් දහස් ගණනක් ගෙවා හෝ පැමිණ බිත්තර දැමීම විශ්මිතය. මේ සඳහා ඉතා අධික දුර ප්‍රමාණයක් වේගයෙන් පිහිනා යාමට පහසු අයුරින් මේ සතුන්ගේ ශරීරය සකස් වී පවතී. පෙර හා පසු ගාත්‍රාවල පිහිටීම හා ශරීරයේ කවාකාර හැටයි. එය වඩාත් පහසුකරයි.

ලොව ජීවත්වන කැස්බෑවන් ප්‍රධාන වශයෙන් වර්ග 7 කට බෙද දැක්විය හැකිය. ඒ,

* දර කැස්බෑවා (Leathery Turtle)
* මඩ කැස්බෑවා / බටු කැස්බෑවා (Olive logger – head Turtle)
* පොතු කැස්බෑවා (Hawksbill Turtle)
* ඔළුගෙඩි කැස්බෑවා (Loggerhead Turtle)
* ගල් කැස්බෑවා (Green Turtle)
* කළු කැස්බෑවා (Black Turtle)
* පැතලි කැස්බෑවා (Flat back Turtle)

මේ අතරින් කැස්බෑ වර්ග 5 ක් ශ්‍රී ලංකා වෙරළින් සොයාගැනීමට හැකිවීම විශේෂත්වයකි. ඒ ඔවුන් බිත්තර දැමීම සඳහා ලංකා වෙරළේ විවිධ ස්ථාන තෝරාගෙන සිටීම හේතුවෙනි.

දර කැස්බෑවා, විශාලත්වයෙන් වැඩිම කැස්බෑවා ලෙස සැලකෙයි. මේ සත්ත්වයාගේ විද්‍යාත්මක නාමය Dermochelys Corracea වේ. දිග මීටර් 3 ක් පමණවන මේ කැස්බෑවාගේ වැඩුනු සතකු බරෙන් කිලෝග්‍රෑම් 600 ක් පමණ වේ. මාංශ භක්ෂකයකු වන දර කැස්බෑවා ආහාර හිඟ අවස්ථාවල ඉතා සීතල ආක්ටික් මුහුදු ප්‍රදේශයට ද යයි. උගේ හමේ ඇති ඝණකම් මේද තට්ටුවෙන් ශීර උෂ්ණත්වය පාලනය කරගත හැකි අතර ඝණකම් සහිත කටුව ගැඹුරු මුහුදේ කිමිදීමට හැකියාව ලබාදී තිබේ.

ඉන්දියානු අත්ලාන්තික් හා පැසිපික් සාගර ප්‍රදේශවල දැකිය හැකි මේ කැස්බෑවා ප්‍රධාන වශයෙන් බිත්තර දැමීම සඳහා තෝරාගෙන සිටින්නේ මැලේසියානු දූපත් නැගෙනහිර වෙරළයි. බිත්තර දැමීම සඳහා ශ්‍රී ලංකා වෙරළටද පැමිණෙන මෙම කැස්බෑවා වරකට බිත්තර 40–50 පමණ ප්‍රමාණයක් දමයි. වෙරළේ ඇති උණුසුමින් බිත්තර පුපුරා රාත්‍රී කාලයේදී පමණක් පැටවුන් බිහිවීමද විශේෂත්වයකි.

මඩ කැස්බෑවා හෙවත් බටු කැස්බෑවා නමින් හඳුන්වන කැස්බෑවාගේ විද්‍යාත්මක නාමය Lepidochelys Olivacea වේ. බරින් කිලෝග්‍රෑම් 50 ක් පමණ වන හා දිගින් සෙ.මී. 75 පමණ වන මේ කැස්බෑවාගේ මුහුණ උල්වූ කොටස් සහිත ගිරවකු සිහිගන්වන බැවින් ගිරාහොටා යන අන්වර්ථ නාමයෙන් ද හඳුන්වයි. ඉන්දියන් සාගරයේද ජීවත්වන මොවුන් බිත්තර දැමීම සඳහා ශ්‍රී ලංකංවේ වෙරළට ද අවුරුදු පතාම පැමිණෙයි.

අගෝස්තු / දෙසැම්බර් මාසවල බිත්තර දමන අතර දින 50–65 අතර කාලයකදී බිත්තර පුපුරා පැටවුන් මුහුදට ඇදී යයි.

පොතු කැස්බෑවා Eretomochelys imbricta යන විද්‍යාත්මක නමින් හඳුන්වන අතර බරින් කිලෝ පනහක් පමණ වේ. ඉතා ලස්සන උඩු කබලක් ඇති නිසා ඔවුන් අනෙක් කැසුබුවන්ගෙන් වෙන්කර හඳුනාගත හැකිය.

උකුසු හොටා, පනා කැස්බෑවා, කත්තාඩි කැස්බෑවා වැනි විවිධ නමවලින් හඳුන්වන මෙම කැස්බෑ වර්ගය ලොවට හඳුන්වා දෙන ලද්දේ 1766 වසරේදී ය.

ඔළුගෙඩි කැස්බෑවා හෙවත් කත්තාඩි කැස්බෑවා නමින් හඳුන්වන කැස්බෑවාගේ විද්‍යාත්මක නාමය වන්නේ Caretta Caretta යන්නයි. දිගින් මීටරයක් පමණ වන මෙම කැස්බෑවකු බරින් කිලෝග්‍රෑම් 180 ක් පමණ වේ. මාංශ භක්ෂකයකු වන මෙම කැස්බෑවා බිත්තර දැමීම සඳහා වැඩිවශයෙන් නිවර්තන රටවල වෙරළවල් තෝරා ගනී. නොවැම්බර් ජනවාරි අතර කාලයේදී ගැහැනු සතෙකු වරකට බිත්තර 150 ක් පමණ දමයි.

ගල් කැස්බෑවා, කැසුබුවන් අතර ඉතා අලංකාරය. Green Turtle නමින් හඳුන්වන මෙම කැසුබුවා මඩ කැස්බෑවා, හා වැලි කැස්බෑවා ලෙසද හඳුන්වයි. විද්‍යාත්මක නාමය වන්නේ Chelonie nydas යන නාමයයි.

කළු කැස්බෑවා ද (Chelonia agassizii) ගල් කැස්බෑවාගේම නෑයෙකු බව පැවසෙන අතර කෙම්ප්ගේ බටු කැස්බෑවා ද මඩ කැස්බෑවාගේ ඥතියකු ලෙස හැඳින්වේ. කුඩාම කැස්බෑවා ලෙස හඳුන්වන්නේ කෙම්ප්ගේ බටු කැස්බෑවා ය. උගේ දිග සෙ.මී. 80 නොඉක්මවයි. මෙක්සිකෝ බොක්ක අවට දැකිය හැකි මේ කැස්බෑවන් ඉතා දුර්ලභය.

මාංශ භක්ෂක කැසුබුවකු වන පැතලි කැස්බෑවා ගේ විද්‍යාත්මක නාමය Natator depressas වේ. ඕස්ට්‍රේලියාව, ක්වින්ස්ලන්තය ආශ්‍රිතව පමණක් වාසය කරයි. මොහු මෙන්ම කළු කැස්බෑවන්ද ශ්‍රී ලංකාව අවට්න් හමුනොවේ.

ලොවේ රටවල් කිහිපයකින් කැසුබුවන් ගේ රුව දැක්වෙන මුද්දර නිකුත්කර තිබේ.

අප රටින් මෙතෙක් කැසුබුවන් මුද්දරයට නඟා නොමැති අතර එය ජාත්‍යන්තර අවධානය යොමුකරවන සුළු මාතෘකාවක් බව පැවසිය යුතු ය. ❑

**අනුර සමරවීර**